# මතභේදයන්ට තුඩුදුන් 13 වෙනි ව්‍යවස්ථා සංශෝධනය

13 ඉලක්කම ගැන බොහෝ දෙනා තුළ ඇත්තේ බියකි. 13 සඳහන් වන නිවසක්, වාහනයක්, හෝටල් කාමරයක් සොයාගත නොහැකි තරම්ය. විශේෂයෙන්ම මෝටර්රථ ලියාපදිංචි කිරීමේදී 13 අංක සහිත වාහන ලබා ගැනීමට කවුරුත් මැලිවෙති. මේ නිසා 13 ඉලක්කම අබියස වාහන ලියාපදිංචිවීමද මාස ගණන් නතරවේ. එයට පිළියමක් ලෙස ශ්‍රී ලංකාවේ 13 ඉලක්කම සහිත වාහන අංක ලියාපදිංචි කිරීමේ ලේඛනයෙන් අහෝසිකර දැමීමට 1994 දී රජය පියවර ගත්තාය.

අංක 13 නිසාමදෝ දෛවයේ සරදමකට මෙන් ශ්‍රීලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය නැවතත් කතාබහට ලක්ව මහත් ආන්දෝලනයක් හටගෙන ඇත. 1978 සිට ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වරින්වර සංශෝධනයට ලක්විය. මේවන විට සංශෝධන 19 ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත්ව එයින් 3 ක් හැර, එනම් 12 වන, 18 වන සහ 19 වන වගන්තිය හැර, අනෙකුත් සියළු සංශෝධන සම්මත වී ක්‍රියාත්මක වේ. සම්මත නොවූ සංශෝධන 3 පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත්වූ නමුත් නියමිත පරිදි සාකච්ඡා නොවීම නිසා අහෝසි වී ඇත. යෝජනා ඉදිරිපත් කිරීමේ පිළිවෙල අනුව ඒ සඳහා අංකයක් ලබා දේ. ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් ඉදිරිපත් කළ හැකි අතර, එහි අනුකූලභාවය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ අනුමැතිය ලබා, පාර්ලිමේන්තුවේදී විවාද කොට, තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් සම්මත කරගත යුතු වේ.

1985 දී එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුව සිටි සරත් මුත්තෙට්ටුවගම මහතා ව්‍යවස්ථා සංශෝධන යෝජනාවක් ගෙන ආවේය. එයින් යෝජනා කළේ ජනාධිපතිවරයාට එරෙහිව නඩුපැවරිය හැකි ය යන්නය. ඒ වන විට සංශෝධන 11 ක් ඉදිරිපත්වී සම්මත වී තිබුණු බැවින් සරත් මුත්තෙට්ටුව ගෙන ආ යෝජනාවට අනු පිළිවෙල අනුව අංක 12 ලැබිණ. එම සංශෝධනයට එවක පැවති ජේ. ආර්. රජය ප්‍රමුඛත්වය නොදුන් නිසා පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට පමණක් එය සීමා විය. මෙම යෝජනාව න්‍යාය පත්‍රයේ තිබියදීම රජය විසින් පළාත් සභා පිහිටුවීම පිළිබඳව වූ ව්‍යවස්ථා සංශෝධනයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එම යෝජනාවට ලැබුණු අනු අංකය වූයේ 13 යි.

පළාත් සභා පිහිටුවීම සඳහා ඉදිරිපත්කළ 13 වන සංශෝධනයට ආරම්භයේ සිටම මහත් අභියෝගවලට මුහුණදීමට සිදුවිය. එයට එරෙහිව එවකට විරුද්ධ පක්ෂ නායිකාව වූ සිරිමා බණ්ඩාරනායක මැතිනිය ප්‍රමුඛ දේශපාලන නායකයින් කොළඹ පිටකොටුවේ දී විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කළහ. ජේ. ආර්. රජය ඊට දැඩිව දැක්වූ ප්‍රතික්‍රියා හේතුවෙන් දෙදෙනෙකු මිය ගොස් බොහෝ අයට තුවාල සිදුවිය. එදා ජනතා විමුක්ති පෙරමුණ 13 වන සංශෝධනයට සහාය දෙන අයට මරණීය තර්ජන එල්ලකිරීමට තරම් ප්‍රකෝපකාරී වීය.

එදා 13 වන සංශෝධනයට විරුද්ධ වූ බොහෝ දේශපාලන පක්ෂ හා පුද්ගලයන් අද එයට පක්ෂව සිටිනවා පමණක් නොව පළාත් සභා මුල් පුටුවල යෙහෙන් වැජඹෙති. වැඩිපුර බලතල ද ඉල්ලති. 13 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් පළාත් සභා පිහිටුවීමට අවශ්‍ය ව්‍යවස්ථාමය බලතල ලැබිණ. වර්තමානයේ දැඩි ආන්දෝලනයක් වී ඇත්තේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයේ අඩංගු බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධවයි.

පළාත් සභා පිහිටුවීමේ දී මධ්‍යම රජයට අයත් කාර්‍යභාර විෂයයන් සංවෘත ( **Reserved**) විෂයයන් ලෙසද, පළාත් සභාවට අයත් කාර්‍යභාරයන් සමගාමී ( **Concurrent** ) විෂයයන් ලෙසද නම් කෙරිණ. ඉඩම් පිළිබඳව සහ අභ්‍යන්තර ආරක්ෂාව පිළිබඳව විෂයයන් අයත්ව ඇත්තේ සංවෘත විෂයයන් ලෙස මහ ආණ්ඩුවට ය.

උතුරු නැගෙණහිර පළාත් සභාවේ වැඩි අවධානය යොමුව ඇත්තේ පෙර කී ඉඩම් පිළිබඳ බලතල හා පොලීසිය පිළිබඳ බලතල මහ ආණ්ඩුවෙන් තමන් වෙත ලබාගැනීමටය. පසුගිය දා නිමවුණු දෙමළ ත්‍රස්තවාදය ඔස්සේද මේ පිළිබඳව විවිධ මත පළවිය. උතුරේ දේශපාලකයන්ටද අවශ්‍ය වූයේ මෙම බලතල තම පළාත් සභාවලට ලබාගැනීමය.

ඉන්දියාවේ මේ හා සමානව පෙඩරල් ආණ්ඩුක්‍රමයක් පවතින අතර, ඉඩම් හා පොලිස් බලතල ප්‍රාන්ත රාජ්‍ය යටතේ ක්‍රියාත්මක වේ. ඒ නිසාම ඉන්දියාවේ දැඩි කැමැත්ත වී ඇත්තේ ලංකාවේ පළාත් සභාවලටද ඉඩම් හා පොලිස් බලතල ලබාදීමට ය. ඒ සඳහා ඉන්දියාවේ බලපෑමක්ද දක්නට ඇත. ඉන්දියාවට මේ සඳහා මෙතරම් රුදාවක් ඇත්තේ මන්දැයි කිසිවෙකු අසන පාටක්ද නැත.

ඉන්දියාව සමග සසැඳූ කල ඉතා කුඩා රටක් වූ ශ්‍රීලංකාව තුළ දැනට පළාත් සභා 9 යක් ඇත. මහා ආණ්ඩුවට පාලනය කරගත හැකි ඉඩම් හා පොලිස් බලතල පළාත් සභාවලට ලබාදීම අවශ්‍යදැයි කල්පනා කළ යුතු වේ.

13 වන ව්‍යවස්ථා සංශෝධනය පරිදි පිහිටවූ පළාත් සභාවලට බෙදා ඇති බලතල නැවත වෙනස්කිරීමට නම් නැවතත් ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ආ යුතුවේ. එය තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් සම්මත විය යුතු ද වේ. ඕනෑම දේශපාලකයෙකු හෝ දේශපාලන ආයතනයක් උත්සාහකරන්නේ තම බලතල වැඩිකරගැනීමටය. විශේෂයෙන් දැන් පිල්ලෙයාන් මහ ඇමතිව සිටින නැගෙණහිර පළාත් සභාව තම බලතල වැඩිකර ගැන්මට මාන බලන හැටි අපට පෙනේ.

ලෝකයේ රටවල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා දෙකකි. ඒ ලිඛිත **written** හා අලිඛිත **unwritten** යනුවෙනි. මහා බ්‍රිතාන්‍යයට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් නැත. ඔවුන් ක්‍රියා කරනුයේ සම්ප්‍රදායන් සහ පූර්වාදර්ශ අනුගමනය කිරීමෙනි. මහා බ්‍රිතාන්‍යය හා නවසීලන්තය හැර අන් සෑම රටකටම ලිඛිත ව්‍යවස්ථාවක් ඇත. ඉරානයේ සහ ඊශ්‍රායලයේ ආගමික නායකයන්ගේ බලය ව්‍යවස්ථාවට වඩා ඉහළින් බලපායි.

ව්‍යවස්ථාවක ඇති වගන්තියක්, වාක්‍යයක් හෝ වෙනස් කරන්නේ නම් ඒ සඳහා සම්මත සංශෝධන ක්‍රියාවලියක් තිබේ.

ශ්‍රීලංකාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයේ ඇති බලතල තවත් වැඩිකර ගැන්මට දෙමළ කොටි ත්‍රස්තවාදීහු උත්සාහ කළහ. සාම සාකච්ඡාවලදී ද මේ ගැන දැඩි අවධානය යොමු කළහ. කොටි ත්‍රස්තවාදය අද සුන්වී ඇතත් දෙමළ දේශපාලකයන් තවමත් බලතල සඳහා වෙහෙසෙනු පෙනේ.

රට බෙදා නිසැකවම ඊළමකට පාර කපන දීර්ඝ කාලීන ව්‍යසනයක් ලෙස බොහෝ සිංහළ ජනතාව 13 වෙනි සංශෝධනය දෙස බලති. ද්‍රවිඩ බෙදුම්වාදීන්ගේ අරමුණු කුමක්දැයි හොඳින් දන්නා ඔවුන්ගේ ඒ සැකය සාධාරණය. යම් කලෙක මෙය අප රට විශාල අවුලකට පත් කරනවා වෙන්නට පුළුවන. ප්‍රතිඵලය කුමක් වේදැයි නිශ්චිතවම අද දවසේ කිසිවෙකුට කියන්නට බැරි ය.

13 වන ව්‍යවස්ථා සංශෝධනය පරිදි පළාත් සභා විෂය ලැයිස්තුව ජනාධිපතිවරයාට හෝ කිසිම කෙනෙකුට වෙනස් කළ නොහැකිය. එසේම එම ලැයිස්තුව වෙනස් කරන්නටයයි ඉල්ලා සිටීමටද නොහැකිය. සංවෘත ලැයිස්තුවේ සඳහන් ඉඩම් බලතල හා පොලිස් බලතල පළාත් සභාවලට දීමට අවශ්‍ය නම් කළ යුත්තේ නැවත ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනැවිත් විෂය ලැයිස්තුව වෙනස්කිරීමයි. අද දින තත්වය අනුව එවිට එම සංශෝධනය 20වන ව්‍යවස්ථා සංශෝධනය ලෙස පාර්ලිමේන්තු න්‍යයා පත්‍රයට ඇතුළත් වෙනවා ඇත.

ශ්‍රීලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කළ ආචාර්‍ය කොල්වින් ආර් ද සිල්වා මහතා ව්‍යවස්ථාව වෙනස් කරනවාට තදින් විරුද්ධවිය. එතුමා එදා කීවේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙහෙම හිතුමනාපයේ සැරින් සැරේ වෙනස් කරන්න ගියොත් ඒක හරියට මාස්පතා පිටවෙන මාසික සඟරාවක් වේවි යන්නය. එතුමා අද නැතත් ඒ වටිනා කියමන ශ්‍රීලංකාව තදින් සිහියට ගැනුම වටී.

**ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරී**
**මේජර් වී. බී. කරුණාරත්න**
**Oxford UK**

**Duke's Court Travel**
DUKE'S COURT TRAVEL Travel Management

**Fly to Colombo**

SriLankan Airlines fr £320 + Taxes
Qatar Airways fr £280 + Taxes
Kuwait Airways fr £200 + Taxes
Emirates fr £375 + Taxes
Oman Air fr £165 + Taxes

Note: All fares mentioned are low season / terms & conditions apply.

**020 8748 3535 / 0800 112 0535**

204 King Street, London W6 0RA

**VALUABLE INVESTMENT OPPORTUNITIES IN SRI LANKA TO MEET YOUR EXPECTATIONS**

Tea / Rubber / Coconut Plantations
Colonial Bungalows / Beach Lands
Residential Properties
in Colombo / Suburbs.

**ALEXIS AUCTIONS LTD**
15, Pirivena Mawatha, Ratmalana, Sri Lanka.
Tel : 0094 112717819 / Mob: 0094 777739100
E-mail : alexisauctions@yahoo.com

**ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න**

FAST CASH
SEND TODAY - COLLECT TODAY

Transfer Fees From only £5

June Offer!
FREE Money Transfer for
You + Friend

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

COMMERCIAL BANK · BOC BANK OF CEYLON · HNB · HSBC · සම්පත් බැංකුව SampathBank · PEOPLE'S BANK · Standard Chartered

MCG Mike Cooke Group
දින 7ම විවෘතයි

www.efastcash.biz
020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT

